**රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2016**

-----------------------------------------------------------------

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවනු ලබන නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උපාය මාර්ගික හා සමාජ ආර්ථික මට්ටම ඉහළ නැංවීම සඳහා දක්ෂිණ අධිවේගි මාර්ගයට හා මධ්‍යම අධිවේගී මාර්ගයට අතරමැදිව සබරගමුව පළාත හා බස්නාහිර පළාතෙන් කොටසක් ආවරණය වන පරිදි නව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම ව්‍යාපෘතියෙහි අරමුණ වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව, සහ

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

-----------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට සහ මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදුන් එකතුව රු.මිලියන 3.41 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ වියදමට ලියාහැර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 අරමුදල් උපයෝජනය**

------------------------

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අධිවේගී මාර්ගයේ මූලික වැඩ කටයුතු කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා රජයෙන් වෙන්කරන ලද අරමුදල්වලින්, රු.මිලියන 37.50 ක් ව්‍යාපෘතිය වැයකර තිබුණි. ලැබුණු තොරතුරුවලට අනුව,මෙම ව්‍යාපෘතිය සඳහා විදේශාධාර ලබාගත හැකි අවස්ථාවන් පිළිබඳව 2016 දෙසැම්බර් 31 දිනටද සොයා බලමින් තිබුණි.

**3.2 භෞතික කාර්යසාධනය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරුවලට අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සමාලෝචනයන්, නිරීක්ෂණයන්, මූලික සැලසුම්, සමාජ හා පාරිසරික බලපෑම් අධ්‍යයනය සහ බේරුම් කිරීමේ කාර්යයන්ද ඇතුලත්ව ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා උපදේශක සේවා සැපයීම් කාර්යයෙහි නියැලි එහි පරිපාලිත සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. උපදේශක සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුවට අනුව උපදේශක සේවා සැපයීම 2015 ජුලි 30 දින අවසන් කළ යුතුව තිබුණද, අදාල වාර්තාවන් 2017 දෙසැම්බර් 31 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු වුවත් එම වාර්තාව ලබාගෙන නොතිබුණි. එසේ වුවත්, භූමි සැලසුම් අධ්‍යයනයන් මූලික නිර්මාණ සැලසුම් යනාදිය සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ කර තිබුණි.